දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2012 පෙබරවාරි
# First Examination in Arts (External) – February 2012

ආවිප්‍ර 1.2 - ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය
# EC 1.2 – History of Economics Development

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

(01) (i) 12 වන හා 13 වන සියවස්වල ක්‍රියාත්මක වූ වැඩවසම් ක්‍රමයේ හඳුනා ගත හැකි පොදු ලක්ෂණ කවරේ ද?

(ii) දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික ලක්ෂණයන්ගෙන් හෙබි වැඩවසම් සමාජ ව්‍යුහය විග්‍රහ කළ හැක්කේ කෙසේ ද?

(iii) 14 වන හා 15 වන සියවස් කාලයේ දී වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටීමට ඉවහල් වූ සාධක කවරේ ද?

(02) (i) කාර්මික විප්ලවය සහ ඒ ආශ්‍රිතව ඇති වූ සමාජ ආර්ථික වෙනස්වීම් පළමු කොට මහා බ්‍රිතාන්‍ය සතු කර ගැනීමට හැකි වූයේ කෙසේ ද?

(ii) පසු කාලයේ දී මහා බ්‍රිතාන්‍ය සතු ඒකාධිකාරිත්වය වෙනත් දියුණු රටවල් කරා ගමන් කිරීම සනාථ කිරීමට ඉදිරිපත් කළ හැකි සාධක කවරේ ද?

(03) "ප්‍රංශ විප්ලවය ආර්ථික හා දේශපාලන සාධක බලපෑම් හේතු කොට ගෙන ඇති වූ ක්‍රියාවලියක් හෙයින් එය දේශපාලන විප්ලවයක් වශයෙන් ඇතැම්හු හඳුන්වති." මෙම අදහස සනාථ කිරීමට ප්‍රමාණවත් සාධක ගෙන හැර දක්වන්න.

(04) (i) රුසියාවේ විප්ලවවාද නිර්ධන පංති නායකයා ලෙස ලෙනින් පිළිගැනීමට ඉවහල් වන්නා වූ හේතූන් කවරේ ද?

(ii) ලෙනින්ගේ නායකත්වය, රුසියානු සමාජ ආර්ථිකය ගොඩ නැංවීමට ගන්නා ලද යෝජනා සහ ඒවායේ සාර්ථකත්වය ට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.

(05) පහත සඳහන් ඕනෑම කරුණු දෙකක් පිළිබඳව සටහන් ලියන්න

(i) ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය

(ii) ශ්‍රී ලංකාවේ දස අවුරුදු සැලැස්ම

(iii) රාජ්‍ය නිර්බාධවාදය

(iv) ප්‍රිසියෝ කැට්වාදය

(06) (i) වර්ෂ 1833 දක්වා බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ ගැමි ආර්ථිකය, කෘෂිකර්මාන්තය සහ ඉඩම් භුක්ති ක්‍රමයේ මූලික ලක්ෂණ යනාදිය පැහැදිලි කරන්න.

(ii) කොල්බෲක් - කැමරන් යෝජනා යටතේ රාජකාරී ක්‍රමය අහෝසි කිරීම ග

(iii) මගින් නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය කර ගැනීමට බ්‍රිතාන්‍යයින් කෙතෙක් දුරට සමත් වූයේ ද? විචාරාත්මකව විමසන්න.

(07) (i) ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත ආර්ථිකය සම්බන්ධව වතු වගාව කවර ආකාරයේ බලපෑමක් සිදු කළේද යන්න විමර්ශනය කරන්න.

(ii) 1840 ගණන්වල මැද භාගයෙන් පසුව ශ්‍රී ලංකාවේ කෝපි කර්මාන්තය පරිහානියට පත්වීමට බලපාන ලද සාධක පැහැදිලි කරන්න.

(08) (i) ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ පරිහානියත් සමඟ තේ වගාව සඳහා නැඹුරු වීමේ දී බ්‍රිතාන්‍ය වැවිලිකරුවන් මුහුණ දුන් සංරෝධක කවරේ ද?

(ii) 1870 ගණන්වලින් පසුව ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ශීඝ්‍ර ව්‍යාප්තිය සඳහා ඉවහල් වූ සාධක සාකච්ඡා කරන්න.

*****************************************************